පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ :-2026/07

මගේ අංකය:එන්සීපී/සීඑස්/පීටී/එෆ්ආර්05/07
පළාත් භාණ්ඩාගාරය,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත.
2026.07. 01

ආණ්ඩුකාරවර ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
පළාත් සභා ලේකම්,
අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් ,
පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා,
ව්‍යවස්ථාපිත අධිකාරී ආයතන ප්‍රධානීන් වෙත.

**<u>උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල වාහන අලුත්වැඩියා, වාහන සේවා කිරීම, මුද්‍රණ කටයුතු හා ආරක්ෂක සහ පිරිසිදු කිරීමේ සේවා සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය වෙතින් සිදුකර ගැනීම</u>**

උතුරු මැද පළාත් සභාවේ ව්‍යවස්ථාපිත අධිකාරී ආයතනයක් වන සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය වර්තමානයේ මුහුණ දී ඇති මූල්‍ය ගැටළු හා එම ආයතනයේ කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම් ඇතුළු නඩත්තු වියදම් පළාත් සභාවේ අයවැය ලේඛනය මගින් දැරීමට සිදු වීම යන කරුණු සැලකිල්ලට ගෙන, එම ආයතනයේ ආදායම් තත්ත්වය වර්ධනය කිරීමේ උපාය මාර්ගයක් ලෙස එම ආයතනය වෙතින් පහත කොන්දේසිවලට යටත්ව උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ආයතනවල වාහන අලුත්වැඩියා, වාහන සේවා කිරීම, මුද්‍රණ කටයුතු, ආරක්ෂක සේවා, පිරිසිදු කිරීමේ හා වෙනත් සේවා ලබා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇත.

- අදාල සේවා එම ආයතනයේ අභ්‍යන්තර සේවකයන්ගෙන්ම සිදුකරගත යුතු බව
- අනෙකුත් තරඟකාරී ආයතනවලට සාපෙක්ෂව එම සේවා සඳහා එම ආයතනයේ මිල වැඩි නොවන බව
- එම ආයතනය වෙත එම සේවා සැපයීමට අවශ්‍ය වන උපකරණ, විශේෂඥතාවය හා ඊට අවශ්‍ය වන නෛතික හැකියාව පැවතිය යුතු බව

02. ඉහත කොන්දේසිවලට යටත්ව එම සේවා ලබාදිය හැකි බව එම ආයතනය විසින් ලිඛිත තහවුරුවක් ලබාදී ඇත.

03. ඒ අනුව, ඔබ අමාත්‍යාංශයට /දෙපාර්තමේන්තුවට/ ආයතනයට අනුයුක්ත කර ඇති වාහන වල සියළු ආකාරයේ අළුත්වැඩියාවන් හා සේවා කටයුතු, මුද්‍රණ කටයුතු, ආරක්ෂණ හා පිරිසිදු කිරීමේ සේවා හා වෙනත් සේවා 2026.07.01 දින සිට 2026.12.31 දක්වා බලපැවැත්වෙන පරිදි එම ආයතනයෙන් සිදුකර ගැනීමට කටයුතු කල යුතු වේ.

04. මෙම ආයතනය වෙතින් වාහන අළුත්වැඩියා සිදුකර ගැනීමේදී පහත උපදෙස් අනුගමනය කල යුතුය.

04.1. මීට අමුණා ඇති ඇමුණුම 01හා 02 හි සඳහන් ආකෘති අනුව වාහන අළුත්වැඩියා සඳහා ඇස්තමේන්තුවක් හා අළුත්වැඩියාවෙන් පසු වගකීම් සහතිකයක් එම ආයතනය වෙතින් ලබා ගැනීම.

04.2. වාහන අළුත්වැඩියාවට පෙර හා පසු පළාත් මූල්‍ය රීති අනුව හා අනෙකුත් චක්‍රලේඛ විධිවිධාන අනුව රජයේ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු වෙතින් පූර්ව අළුත්වැඩියා හා පසු අළුත්වැඩියා නිර්දේශ ලබා ගැනීම.

04.3. එම ආයතනයෙන් බැහැරව පෞද්ගලික ගරාජයකින් හෝ නියෝජිත ආයතනයකින් වාහන අළුත්වැඩියාවන් සිදුකල යුතු වන්නේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සියට එම අලුත්වැඩියාව භාරගත නොහැකි බවට ලිඛිතව තහවුරු කළ විට පමණි.

04.4. ඉහත 4.3. සඳහන් පරිදි පෞද්ගලික ගරාජවලින් වාහන අළුත්වැඩියාවන් සිදුකරන්නේ නම්, සෑම විටම තරඟකාරී මිල කැඳවා සිදු කළ යුතුය.

05. මුද්‍රණ කටයුතු සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සියට භාර දීමේදී, පාසල් ප්‍රශ්න පත්‍ර වැනි රහස්‍ය භාවය ආරක්ෂා කර මුද්‍රණය කල යුතු හෙයින්, දෙපාර්ශවය විසින් රහස්‍යභාවය රැකෙන පරිදි කටයුතු කල යුතුය.

06. වාහන නඩත්තු හා සේවා අංශ පවත්වාගෙන යනු ලබන දෙපාර්තමේන්තු/ආයතන විසින් තම ආයතනයට අනුයුක්ත වාහන අළුත්වැඩියාවන් තම ආයතනය මගින් සිදුකර ගත හැකි අතර සමහර අළුත්වැඩියා සිදුකරගත නොහැකිවන විට එම වාහන අලුත්වැඩියාවන් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය වෙතින් සිදු කර ගත යුතුය.

07. ඉහත සඳහන් සේවා සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සියෙන් ලබාගත් පසුව එම සේවාවල ගුණාත්වය පිළිබඳව ගැටළුවක් පවතින්නේ නම්, මා වෙතද පිටපත් සහිතව එම ආයතනයට දැනුම් දී නිවැරදි කර ගැනීමට කටයුතු කරන ලෙසද වැඩිදුරටත් දැනුම් දෙමි.

ජේ.එම්.ආර්.පී.ජයසිංහ,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

පිටපත් :

01. විගණකාධිපති - දැ.පි.
02. ප්‍රධාන අභ්‍යන්තර විගණක, උතුරු මැද පළාත - දැ.පි.

ඇමුණුම 01

වාහන අංකය :-

| අනු අංකය | අමතර කොටස්/වැඩ පියවර | විකල්ප මිල ගණන් 01 | විකල්ප මිල ගණන් 02 | |
|---|---|---|---|---|
| | | නියෝජිත ආයතන අමතර කොටස් සඳහා මිළ (රු) | පිළිගත් අමතර කොටස් සඳහා මිල (සන්නාම අනුව) | |
| | | | සන්නාමය | මිල (රු) |
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |
| 6 | | | | |
| 7 | | | | |
| 8 | | | | |
| 9 | | | | |
| 10 | | | | |
| 01. | අමතර කොටස් සඳහා මුළු මිල (වැට් (VAT රහිතව) | | | |
| 02. | අළුත්වැඩියාවන් සඳහා වැඩ කුලී | | | |
| | අයිතම 01 | | | |
| | අයිතම 02 | | | |
| | අයිතම 03 | | | |
| | අයිතම 04 | | | |
| | එකතුව(වැට් (VAT රහිතව) | | | |
| 03. | අමතර කොටස් සවි කිරීම සඳහා වැඩ කුලිය(වැට් (VAT රහිතව) | | | |
| | අවසාන එකතුව (වැට් (VAT රහිතව) | | | |
| 04 | VAT මුදල | | | |
| 05 | අවසාන එකතුව (වැට් (VAT සහිතව) | | | |

වගකීම් කාලය :-

සකස් කළේ :-

අත්සන :-.........................

දිනය :-.........................

පරීක්ෂා කළේ :-

අත්සන :-.........................

දිනය :-.........................

අනුමත කළේ :-

අත්සන :-.........................

දිනය :-.........................

නිල මුද්‍රාව :-.....................

ඇමුණුම 02

# අළුත්වැඩියාවෙන් පසු වාහන භාර දීමේ ආකෘති පත්‍රය

ඔබගේ අංක..............................හා ................දිනැති අළුත්වැඩියා ඇණවුම් හා බැදේ.ඒ අනුව,
ඔබගේ අංක ....................................දරණ වාහනයට අදාලව පහත අළුත්වැඩියාවන් සිදු කරන ලදී.

| යොදන ලද අමතර කොටස් පිළිබඳ විස්තර | | අමතර කොටස් සන්නාමය/වර්ගය | වගකීම් කාලය |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |
| 07 | | | |
| 08 | | | |
| 09 | | | |
| 10 | | | |
| සිදු කල වෙනත් අළුත්වැඩියාවන් පිළිබඳ විස්තර | | | |
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |

ඉහත වාහන අළුත්වැඩියා කර, අවසන් කර ඔබ වෙත භාරදෙමි.මේ සඳහා වගකීම් කාලය ....................කි.

අත්සන:-

නම:-

නිල මුද්‍රාව:-

රජයේ යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශය

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

අත්සන:-

නම:-

නිල මුද්‍රාව:-